# තනතුරු ඇබෑර්තු
## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුර

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2025.09.09 දින දක්වා අයඳුම්පත් කැඳවනු ලැබේ.

**01. වැඩ සහායක III ශ්‍රේණිය. (පුරප්පාඩු සංඛ්‍යාව -05)**

**සුදුසුකම්**

අයදුම්කරු අ.පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයක් (06) සමත් වී සිටිය යුතුය.

**වැටුප් පරිමාණය -**

- **U-PL 1 (III) රු. 42,775-16x450-49,975p.m.** (වි.ප්‍ර.කො.ච.ලේ, 02/2025 අනුව)
- ඉහත වැටුපට අමතර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.

**02. කම්කරු (කොන්ත්‍රාත්) (පුරප්පාඩු සංඛ්‍යාව -01)**

අයදුම්කරු 7 වන ශ්‍රේණිය සමත් වී තිබිය යුතුය.

**වැටුප් පරිමාණය -**

- **රු. 42,775p.m. + 17,800 (ස්ථාවර)**

**වයස**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නො අඩු හා 45ට නොවැඩි විය යුතුයි.

**සටහන් -**

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.
(ආ) දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුයි.
(ඇ) විශිෂ්ඨ සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුයි.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය - සම්මුඛ පරීක්ෂණයක් මගින්**

**ප්‍රතිලාභ**

- විශ්වවිද්‍යාල සේවයට බඳවාගනු ලබන අයට විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය හිමිවේ. (අර්ථසාධක අරමුදල සඳහා නිලධාරියාගේ වැටුපෙන් 10% ක මුදලක් සහ විශ්වවිද්‍යාලය මගින් 15%ක මුදලක් බැර කෙරේ.) සේවක භාරකාර අරමුදලට 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් බැර කරනු ලැබේ.

**අයදුම්පත්**

i. සෙ.මී. 23x10 ප්‍රමාණයේ ලිපිනය සහිත, මුද්දර ඇලවූ ලියුම් කවරයක් සහකාර ලේඛකාධිකාරී (ආයතන) වෙත 2025.08.26 දින හෝ ඊට පෙර එවීමෙන් තනතුරට අදාළ අයදුම්පත් හා විස්තර ලබාගත හැකි අතර www.busl.ac.lk වෙබ් අඩවියෙන් ද බාගත හැකිය.

**අයදුම්කරන පිළිවෙළ**

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් **සහකාර ලේඛකාධිකාරී, (ආයතන) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුර** යන ලිපිනයට 2025.09.09 දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
ii. විශ්වවිද්‍යාල/රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අය තම අයදුම්පත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
iii. නියමිත ආකෘතියෙන් ඉදිරිපත්කර නොමැති, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
iv. සුදුසුකම්ලත් අපේක්ෂකයින් පමණක් කෙටි ලැයිස්තු ගතකර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.

**ලේඛකාධිකාරී (රා.ක.ඉ),**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,**
2025.08.10